වැවිලි හා ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යාංශය
පොල් සංවර්ධන අධිකාරිය

පොල් සංවර්ධන අධිකාරියේ දැනට පුරප්පාඩුව පවත්නා පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් හා පළපුරුද්ද ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

**1. තනතුර : අභ්‍යන්තර විගණක**

**පුරප්පාඩු සංඛ්‍යාව : 01**

**සේවා ගණය :** කළමනාකාර සේවා ගණය (MM 1-1)

**වැටුප් ක්‍රමය-** රු.91,690,/- 10x2,480/-, 15x3,450/-, රු.168,240/- M M1-1 2025) (මාසික )+රජයේ අනුමත දීමනා

ආරම්භක වැටුප් පියවර **: රු.**81,710/-

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

i. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණ/වාණිජවේදී/ව්‍යාපාර පරිපාලන/රාජ්‍ය පරිපාලන/කළමනාකරණ උපාධියක් ලබා තිබීම.

හෝ

ii. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ මධ්‍ය පරීක්ෂණය/එංගලන්තයේ පිරිවැය සහ කළමනාකාරීත්ව ගණකාධිකරණ ආයතනයේ ඒ සහ බී යන කොටස් හා වෘත්තීය පළමුවන කොටස/ සහතිකලත් හා සංස්ථාපිත ගණකාධිකාරී ආයතනයේ මධ්‍යම පරීක්ෂණය (එංගලන්තයේ ) සමත්ව තිබීම

iii. ඉහත i හෝ ii හි සුදුසුකම් ලබාගැනීමෙන් පසු විගණන හෝ ගිණුම්කරණ කටයුතු පිළිබඳව අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 03කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

i. පොල් සංවර්ධන අධිකාරියේ JM 1-2 සේවා ගණයේ වැටුප් පරිමාණය හිමි 11 වන ශ්‍රේණියේ තනතුරක වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම.

හෝ

ii. පොල් සංවර්ධන අධිකාරියේ MA 3 වැටුප් පරිමාණය හිමි තනතුරක අදාල ක්ෂේත්‍රයේ වසර 05 කට නොඅඩු සතුටුදායක සේවා කාලයක් තිබීම සමඟ බාහිර අයදුම්කරුවන් සඳහා වන අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසාන දිනට අවුරුදු .25 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන්ට හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**2. තනතුර : සභාපතිගේ ලේකම්**

**පුරප්පාඩු සංඛ්‍යාව :** 01

**සේවා ගණය** - කණිෂ්ඨ කළමනාකාර සේවා ගණය(JM 1-2)

**වැටුප් ක්‍රමය** - රු.74,010/-, 10x1,360/-, 18x2,040=රු.124,330/- (JM 1-2 2025)
( මාසික )+රජයේ අනුමත දීමනා

ආරම්භක වැටුප් පියවර **:** රු.66,781/-

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

**i.** විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් කළමනාකරණ/වාණිජවේදී/ව්‍යාපාර පරිපාලන/රාජ්‍ය කළමනාකරණ/මානව සම්පත් කළමනාකරණ උපාධියක් ලබා තිබීම

**හෝ**

**ii.** තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තිය කුසලතාවයන්හි **(NVQ)** හත්වැනි (07) මට්ටමට නොඅඩු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ ප්‍රවීණතා සහතිකයක් ලබාතිබීම (අදාළ ක්ෂේත්‍රයේ තනතුරක පළපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ)

**හෝ**

**iii.** තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවන්හී **(NVQ)** හයවැනි (06) මට්ටමට නොඅඩු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම

**සමඟ**

ඉහත සුදුසුකම ලබාගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/රාජ්‍ය සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක/පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම

**හෝ**

**iv.** තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික /වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි **(NVQ)** පස්වන (05) මට්ටමට නොඅඩු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**සමඟ**

ඉහත සුදුසුකම ලබාගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක/රාජ්‍ය සංස්ථාවක/ව්‍යවස්ථාපිත මණ්ඩලයක/පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහයකට (10) නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

i. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

ii පොල් සංවර්ධන අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික/තාක්ෂණික නොවන) සේවා ගණයන්හි 11 ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසාන දිනට අවුරුදු .22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන්ට හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**3. තනතුර : අභ්‍යන්තර විගණන නිලධාරී**

**පුරප්පාඩු සංඛ්‍යාව :** 01

**සේවා ගණය :** කණිෂ්ඨ කළමනාකාර සේවා ගණය (JM 1-2)

වැටුප් ක්‍රමය : රු.74,010/-,10x1,360/-, 18x2,040=රු.124,330/-(JM1-2 2025) ( මාසික ) +රජයේ අනුමත දීමනා

**ආරම්භක වැටුප් පියවර :** රු.66,781/-

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද :**

**බාහිර අයදුම්කරුවන් සඳහා**

i විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ගණකාධිකරණය/කළමනාකරණ/වාණිජවේදී/ව්‍යාපාර පරිපාලනය /රාජ්‍ය පරිපාලනය උපාධියක් ලබා තිබීම

හෝ

ii. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වු පිළිගත් වරළත් වෘත්තීය ආයතනයක අන්තර් මධ්‍යම පරීක්ෂණය සමත් වීම

හෝ

iii. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ ) හත්වැනි(07) මට්ටමට නොඅඩු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

iv. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ-) හයවැනි (06) මට්ටමට නොඅඩු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම .

සමඟ

ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 05 කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

v. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ-) පස්වැනි (05) මට්ටමට නොඅඩු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැලපෙන්නා වූ ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම .

සමඟ

ඉහත සුදුසුකම ලබා ගැනීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත මණ්ඩලයක/ පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර දහයකට(10) කට නොඅඩු පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා**

i. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම

හෝ

ii පොල් සංවර්ධන අධිකාරියේ කළමනාකරණ සහකාර (තාක්ෂණික/තාක්ෂණික නොවන) සේවා ගණයන්හි 11 ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසාන දිනට අවුරුදු .22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන්ට හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය-** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**4. තනතුර : වැඩසටහන් සහකාර (තත්ත්ව පාලන)**

**පුරප්පාඩු සංඛ්‍යාව :** 01

**සේවා ගණය :** ආශ්‍රිත නිලධාරී සේවා ගණය (MA 3)

**වැටුප් ක්‍රමය:** රු. 53,940/-,10x800/-,11x1,190/-,10 x 1,320/-,5x1350/-= රු.94,980/-( MA 3-2025 ) (මාසික)+රජයේ අනුමත දීමනා

**ආරම්භක වැටුප් පියවර** : රු.49,831/-

**අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද:**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් රසායන විද්‍යාව, ක්ෂුද්‍ර ජීව විද්‍යා, ජෛව රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව පිළිබඳ උපාධියක් ලබාතිබීම.

**වයස :** අයදුම්පත් බාරගන්නා අවසාන දිනට අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන්ට හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**5. තනතුර : රසායනාගාර කාර්මික ශිල්පී**

**පුරප්පාඩු සංඛ්‍යාව : 02**

**සේවා ගණය** - කළමනාකරණ සහකාර (තාක්ෂණ) (MA 2-2 )

**වැටුප් ක්‍රමය:** රු.50,540/-, 10 x540/-, 7x630/-, 4x1,080/-, 20x1,280/-=රු.90,270/- (MA 2-2 2025)රජයේ අනුමත දීමනා

ආරම්භක වැටුප් පියවර **:** රු.46,960/-

**අධ්‍යාපන සුදුසුකම්:**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල භාෂාව/දෙමළ භාෂාව, ගණිතය, විද්‍යාව, ඉංග්‍රීසි යන විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින්(06) සමත්ව තිබීම.

**සහ**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී විද්‍යා විෂය ධාරාවෙන් සියළුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) එකවර සමත්ව තිබීම.

සමඟ

**තාක්ෂණික නිපුණතා/ප්‍රවීණතා:**

අදාළ තනතුරට නියමිත කාර්මික නිපුණතාව තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවයන්හි (NVQ) පස්වැනි (05) මට්ටමට සරිලන පරිදි ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය, රජයේ කාර්මික පුහුණු ආයතනයක හෝ වෙනත් රජයේ හෝ පෞද්ගලික ආයතනයක් විසින් මෙහෙයවනු ලබන වසරකට නොඅඩු විද්‍යාගාර තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ සහතික පත්‍ර පාඨමාලාවක් හදාරා තිබීම.

අදාළ ක්ෂේත්‍රයේ වසරකට (01) නොඅඩු පලපුරුද්දක් ලබා තිබීම අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**වයස:** අයදුම්පත් බාරගන්නා අවසාන දිනට අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. රජයේ දෙපාර්තමේන්තු, පළාත් රාජ්‍ය සේවය, රාජ්‍ය සංස්ථා , ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන්ට හා පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන්ට මෙම උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්

**ප්‍රතිලාභ :**

1. 1983 අංක 12 දරණ පාරිතෝෂික පනත යටතේ පාරිතෝෂික දීමනා.
2. සේවක වෛද්‍ය රක්ෂණය හා පුද්ගල හදිසි අනතුරු රක්ෂණාවරණය/ කම්කරු වන්දි රක්ෂණය
3. සේවක අර්ථසාධක අරමුදල: සේවකයා 10% සේව්‍යයා 15% සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල සේව්‍යයා 3%
4. අධිකාරියේ සේවකයින්ට දෙනු ලබන අනෙකුත් ප්‍රතිලාභ

**වෙනත් :**

ඉහත සියළුම තනතුරු සඳහා

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2.. දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
3. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
4. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

අයදුම්කරුවන්ගේ වර්තමාන රැකියාව, වැටුප් විස්තර, කලින් දරණ ලද තනතුරු, සේවය කරන ලද කාල සීමාව, සමඟ අයදුම්කරු පිළිබඳ තොරතුරු ලබා ගතහැකි ඥාති සම්බන්ධතාවයක් නොමැති පුද්ගලයන් දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් ඇතුළත්ව අයදුම්කරුගේ සම්පූර්ණ විස්තර සහිතව තමා විසින්ම පිළියෙල කරන ලද අයදුම්පත උප්පැන්න සහතිකය, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් ද සමඟ ලියාපදිංචි තැපෑලෙන් පහත සඳහන් ලිපිනයට **2026.04.07 දින හෝ ඊට පෙර එවිය යුතුය.** අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

රජයේ දෙපාර්තමේන්තු/පළාත් රාජ්‍ය සේවය/රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සිය අයදුම්පත් ආයතන ප්‍රධානී මගින් ද පොල් සංවර්ධන අධිකාරියේ ස්ථිර සේවයේ නියුතු අයදුම්කරුවන් **සිය අයදුම්පත් අංශ ප්‍රධානීන්** මඟින්ද එවිය යුතුය.

අයදුම්පත් එවිය යුතු අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්, ඉහත සඳහන් සුදුසුකම් සහ සහතික පත් නොමැති හා දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානීන් මගින් යොමු කරනු නොලබන **අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

මෙම දැන්වීම පොල් සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවියෙහිද පල කර ඇත. **www.cda.gov.lk**

සභාපති
පොල් සංවර්ධන අධිකාරිය
අංක 54, නාවල පාර,
නාරාහේන්පිට,
කොළඹ 05.